# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1980 අංක 46 දරන සේවානියුක්තයන්ගේ භාර අරමුදල් පනත

[සහතිකය සටහන් කළේ 1980 ඔක්තෝබර් මස 29 වන දින දීය.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.
1980 ඔක්තෝබර් මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 11 වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල්
පනත

[සහතිකය සටහන් කලේ 1980 ඔක්තෝම්බර් මස 29 වන දින]

එල්. ඩී.— ඕ. 49/78

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

2. අමාත්‍යාවරයා විසින් සාදන ලදුව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක සඳහන් වූ ද රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ හෝ යම් පංතියක නැතහොත් වර්ගයක ව්‍යවසායයන්ට අයිති වූ ද රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සෑම ව්‍යවසායකට ම මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය. — මේ පනත අදාළ වීම.

# I වන කොටස

## සේවානියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය පිහිටුවීම

3. (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) සේවානියුක්තයන්ගේ භාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය. — සේවානියුක්තයන් ගේ භාර අරමුදල පිහිටුවීම.

4. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යාවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි, (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) සේවානියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටවනු ලැබිය යුතු ය. — සේවානියුක්තයන් ගේ භාර අරමුදල් මණ්ඩලය පිහිටුවීම.

(2) මණ්ඩලය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර මණ්ඩලය විසින් ස්වකීය නාමයෙන් නඩු පැවරීම ද එකී නාමයෙන් මණ්ඩලයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

(3) අරමුදලේ පරිපාලනය, කළමනාකරණය හා පාලනය මණ්ඩලය වෙත පැවරෙන්නේය.

1988 අංක 47 පනතින් සංශෝධනය කර ඇත.

මණ්ඩලයේ සාමාජිකයෝ

5. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන් නව දෙනාගෙන් මණ්ඩලය සමන්විත විය යුතු ය :-

(අ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් හතරදෙනකු ;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු ;

(ඇ) වෙළඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු ;

(ඈ) ලංකා සේවායෝජකයන්ගේ සංගමය විසින් නම් කරනු ලබන එක් සාමාජිකයකු ; සහ

(ඉ) සාමාජිකයන් එක් ලක්ෂයකට වැඩි සංඛ්‍යාවක් ඇති සෑම වෘත්තීය සමිතියකම විධායකය විමසා අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු ;

1988 අංක 47 පනතින් සංශෝධනය කර ඇත.

මේ ඡේදයේ කාර්ය සඳහා "විධායකය" යන්න වෘත්තීය සමිතියක් හා සම්බන්ධව යෙදෙන විට එයට වෘත්තීය සමිති ආඥාපනතේ දී ඇති අර්ථය ම ඇත්තේ ය.

එසේ වුවද, ප්‍රථම මණ්ඩලය සම්බන්ධයෙන් මෙම උපවගන්තියෙහි (ඉ) ඡේදයෙහි සඳහන් සාමාජිකයන් එක් එක් වෘත්තීය සමිතියෙහි සාමාජිකත්වය 1,00,000 කට වැඩි වෘත්තීය සමිතිවල සාමාජිකයන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, කලින් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔවුන් පත් කරන ලද කාල සීමාව ඉකුත් වන තෙක් ස්වකීය ධූර දරන්නේ ය.

1988 අංක 47 පනතින් සංශෝධනය කර ඇත.

(2) මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා වන මණ්ඩලයේ සභාපතිවරයා, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නේ ය.

(3) මණ්ඩලයේ යම් සාමාජිකයකු ධූරයෙන් ඉවත් කිරීම අමාත්‍යවරයා සුදුසු යයි කල්පනා කරතහොත් අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා එසේ කරනු ලැබිය හැකි ය.

(4) ධූරයෙන් ඉවත් කරනු ලැබ ඇති මණ්ඩලයේ සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කරනු ලැබීම සඳහා හෝ වෙනත් යම් තත්ත්වයකින් මණ්ඩලයට සේවය කිරීම සඳහා හෝ සුදුසු නොවිය යුතු ය.

(5) අමාත්‍යවරයා වෙත කරනු ලබන ලිඛිත දැනුම්දීමක් මගින් මණ්ඩලයේ සාමාජිකයකුට කවර හෝ විටක ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(6) රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තම ධූරයෙහි කාර්ය ඉටු කිරීමට සභාපතිවරයා හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වුවහොත් ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස වෙනත් යම් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(7) මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධූරය කලින් හිස් කරතහොත් මිස මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම අවුරුදු දෙකක කාලයක් තම ධූරය දරන්නේ ය. කාලය ඉකුත්වීමෙන් ධූරය හිස් කරන මණ්ඩලයෙහි යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසු වන්නේ ය.

(8) තම ධූර කාලය ඉකුත් වීමට පෙර මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් තම ධූරය හිස් කරනු ලැබුවහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් තම ධූරය කලින් හිස් කරනු ලබන්නේ නම් මිස, ඔහු අනුප්‍රාප්ත කරනු ලබන්නේ යම් තැනැතත්කු ද ඒ තැනැත්තාගේ ධූර කාලයෙන් ඉකුත් නොවූ කොටස සඳහා ඒ අනුප්‍රාප්තිකයා විසින් ධූරය දැරිය යුතු ය.

(9) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ ලා යම් අක්‍රමිකතාවක් පැවතීම හෝ පමණක් හේතුකොටගෙන මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය.

(10) ස්වකීය කටයුතු පවත්වා ගෙන යාම සඳහා මණ්ඩලය විසින් රීති මගින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

6. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයෙන් සහ එසේ නිශ්චය කරනු ලබන අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය. — මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

7. (අ) මූල්‍ය සම්පාදනයට හා ආයෝජනයට සහභාගි වීමෙන් සේවක අයිතිය, සේවක සුභසාධනය, ආර්ථික ප්‍රජාතාන්ත්‍රිකය ප්‍රවර්ධනය කිරීම ; — මණ්ඩලයේ අරමුණු

(ආ) ව්‍යවසායන්හි සාමාන්‍ය කොටස් අත්කර ගැනීමෙන් කළමණාකරණයෙහි සේවක සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) සේවා නියුක්තයන්ට විශ්‍රාම ගැනීමේ දී දායක නොවන ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම ; සහ

(ඈ) මේ වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ උපකාරී විය හැකි අන් සියලු ක්‍රියා හෝ දේවල් කිරීම,

මණ්ඩලයේ අරමුණු වන්නේ ය.

8. (අ) මේ පනත යටතේ දායක මුදල්, අධිභාර,ණය, ප්‍රදාන, පොලී, ලාභාංශ, සාමාජිකයන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් සේවායෝජකයන් විසින් ගෙවන තැන්පත් මුදල්, බැංකු වලින් හෝ වෙනත් ප්‍රභවයන්ගෙන් ගන්නා ණය සහ ආයෝජනවලින් හා නිශ්චල හෝ චංචල දේපළ විකිණීමෙන් ලබා ගන්නා සියලු මුදල් හෝ වෙනත් කවර වූ හෝ ආකාරයක ගෙවීම් මණ්ඩලය විසින් භාරගත යුතු අතර, මණ්ඩලය විසින් ඒ සියලු මුදල් අරමුදලට බැර කළ යුතු ය. — මණ්ඩලයේ බලතල සහ කාර්ය.

1988 අංක 47 පනතින් සංශෝධනය කර ඇත.

(අඅ) මණ්ඩලය විසින් යම් චංචල හෝ නිශ්චල දේපළක් කවර වූ හෝ ආකාරයකින් අත් කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි ය ;

(ආ) අරමුදලේ මුදල්වල භාරකාරත්වය මණ්ඩලයට තිබිය යුතු ය ;

(ඇ) මණ්ඩලය විසින් සහතික කරනු ලැබූ තැනැත්තන්ට මේ පනත යටතේ ඒ තැනැත්තන් හිමිකම් ලබන ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවිය යුතු ය ;

(ඇ) අරමුදලේ මුදල් අතුරින් මේ පනතේ කාර්යය සඳහා වහා අවශ්‍ය නොවන මුදල් මණ්ඩලය සුදුසු යයි සලකන කොටස්වල හෝ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම හා ඒ කොටස් සහ සුරැකුම්පත් විකිණීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය ;

(ඉ) අරමුදල සම්බන්ධයෙන් පොදු ගිණුමක් ද, අරමුදලේ එක් එක් සාමාජිකයා සම්බන්ධයෙන් (මේ පනතෙහි "පෞද්ගලික ගිණුම" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනම ගිණුමක් ද මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය ;

(ඊ) අරමුදලට අදාළ ගිණුම් පොත් එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනය වන විට තුලනය කරනු ලැබීමට මණ්ඩලය විසින් සලස්වනු ලැබිය යුතු ය ;

(උ) එක් එක් වර්ෂය සඳහා අරමුදල පිළිබඳව ලැබීම් හා ගෙවීම් පිළිබඳ ප්‍රකාශයක් ද ආදායම හා වියදම පිළිබඳ ප්‍රකාශයක් ද වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයක් ද එක් එක් ආයෝජනයේ ප්‍රකාශිත අගය, ගැණුම් මිල සහ වෙළඳ අගය දැක්වෙන ආයෝජන ප්‍රකාශයක් ද පිළියෙල කරනු ලැබිමට මණ්ඩලය විසින් සලස්වනු ලැබිය යුතු ය ;

(ඌ) එක් එක් වර්ෂය සම්බන්ධයෙන් (උ) ඡේදය යටතේ පිළියෙල කරනු ලැබූ එක් එක් ප්‍රකාශයන් හි පිටපතක් ඊළඟ වර්ෂයේ සැප්තැම්බර් මස තිස්වන දිනට පෙර මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත යවනු ලැබිය යුතු ය ;

(එ) ඉහතින් වූ වර්ෂය අවසානයේ දී ස්වකීය පෞද්ගලික ගිණුමේ බැරට ඇති මුදල එක් එක් වර්ෂයේ සැප්තැම්බර් මස තිස් වන දිනට පෙර අරමුදලේ එක් එක් සාමාජිකයා වෙත මණ්ඩලය විසින් නිවේදනය කරනු ලැබිය යුතු ය ;

(ඒ) අරමුදලෙන් මුදල් ආයෝජනය කිරීමෙන් එක් එක් වර්ෂය වෙනුවෙන් ලැබුණ ආදායමෙන් ඒ වර්ෂයේ දී මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා මණ්ඩලය විසින් දරන ලද වියදම් මණ්ඩලය විසින් අඩු කරනු ලැබිය යුතු ය ;

(ඔ) මේ පනතට අනනුකූල නොවන්නාවූ ද මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් මණ්ඩලය වෙත පවරනු ලැබිය හැකි හා නියම කරනු ලැබිය හැකි වූ ද අරමුදල සම්බන්ධයෙන් වෙනත් බලතල හා කාර්ය මණ්ඩලයට තිබිය යුතු ය.

මණ්ඩලයේ මුද්‍රාව

8අ. මණ්ඩලයේ මුද්‍රව —

1988 අංක 47 පනතින් සංශෝධනය කර ඇත.

(අ) මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තන් භාරයේ තිබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය ; තවද

(ඇ) යම් ලේඛනයකට තැබීම, මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහ තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඒ ලේඛනයෙහි අත්සන් තැබිය යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර නොකල යුතු ය.

ආයෝජන

9. මණ්ඩලය විසින් සේවා නියුක්තයන් වෙනුවෙන් යම් ව්‍යාපාරයක, ඒ ව්‍යාපාරයේ කළමනාකරණයෙහි ලා සහභාගි වීම ප්‍රවර්ධනය කිරීමේ අදහසින් කොටස් ලබා ගැනීමේ කාර්ය සදහා නැතහොත් සේවා නියුක්තයන්ගේ අර්ථ ලාභය උදෙසා ආදායම ඉපදවීමේ අදහසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, වාණිජමය හෝ කාර්මික ව්‍යවසායයන් ආරම්භ කොට පවත්වාගෙන යාමේ කාර්යය සදහා හෝ නිශ්චල දේපළ සංවර්ධනය සඳහා අරමුදලින් යම් මුදලක් ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ය .

මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම

10. (1) එක් එක් වර්ෂය වෙනුවෙන් අරමුදලේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උප වගන්තියෙහි විධිවිධාන කෙසේ වුව ද, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හා විගණකාධිපතිවරයාගෙන් විමසා අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම පිණිස සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් පත් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් එවැනි පත්වීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, මණ්ඩලය සම්බන්ධයෙන්, විගණකාධිපතිවරයා විසින් තම කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීම සඳහා එකී විගණකවරයාගේ හෝ විගණකවරුන්ගේ සේවය ප්‍රයෝජනයට ගැනීමට තමා අදහස් කරන බව ඔහුට හෝ ඔවුන්ට ලිඛිතව දන්වන ලැබිය හැකි අතර, ඉන් පසුව එකී විගණකවරයා හෝ විගණකවරුන් විගණකාධිපතිවරයාගේ මෙහෙයවීම හා පාලනය යටතේ කටයුතු කළ යුතු වන්නේ ය.

(3) (අ) විගණකාධිපතිවරයා විසින් මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීමේ දී තමාට සහාය ලබා ගැනීමේ කාර්යය සඳහා තම මෙහෙයවීම හා පාලනය යටතේ කටයුතු කළ යුතු සුදුසුකම් ලත් විගණකවරයකුගේ හෝ විගණකවරයන්ගේ සේවය ලබා ගත හැක්කේ ය ;

(ආ) මණ්ඩලයේ ගිණුම් විගණනයට අදාළ යම්කිසි තාක්ෂණික, වෘත්තීය හෝ විද්‍යාත්මක ගැටලුවක් පරීක්ෂා කිරීමේ දී —

(i) මණ්ඩලයේ සේවා නියුක්තයකු නොවන තැනැත්තකුගේ, හෝ

(ii) මණ්ඩලයේ කටයුතු කළමනාකරණයෙහි ලා කවර හෝ සම්බන්ධතාවක් ඇති ආයතනයක් නොවන යම්කිසි තාක්ෂණික හෝ වෘත්තීය හෝ විද්‍යාත්මක ආයතනයක

සහාය ලබා ගැනීම අවශ්‍ය බව විගණකාධිපතිවරයාගේ මතය වන්නේ නම්, ඔහු විසින් එපරිදෙන් ඒ සේවය ලබාගත හැක්කේය. තවද, ඒ තැනැත්තා හෝ ආයතනය විගණකාධිපතිරවරයාගේ මෙහෙයවීම හා පාලනය යටතේ ක්‍රියා කළ යුත්තේ ය.

(4) (අ) විගණකාධිපතිවරයාට හෝ ඔහුගේ අධිකාරය ලත් කවර හෝ තැනැත්තකුට, මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීමේ දී —

(i) මණ්ඩලයේ සියලු පොත්පත්, වාර්තා, වාර වාර්තා සහ වෙනත් ලියකියවිලි ලබා ගැනීමේ ද,

(ii) මණ්ඩලයේ ගබඩාවලට සහ වෙනත් දේපළවලට පිවිසීමේ ද, සහ

(iii) මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි තොරතුරු හා කරුණු පැහැදිලි කරවා ගැනීම මණ්ඩලය හෝ එහි නිලධරයන් ලවා සපයා ගැනීමට ද

හිමිකම ඇත්තේ ය.

(ආ) මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සඳහා පත් කරන ලද සෑම සුදුසුකම් ලත් විගණකවරයකුට ම නැතහොත් ඔහුගේ අධිකාරය ලත් සෑම තැනැත්තකුට ම, මණ්ඩලය සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි පිවිසීමකට, තොරතුරු ලබා ගැනීමකට සහ කරුණු පැහැදිලි කරවා ගැනීමකට එවැනිම හිමිකමක් ඇත්තේ ය.

(5) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පත් කරන ලද සෑම සුදුසුකම් ලත් විගණකවරයකු ම විසින්, තම වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එහි පිටපතක් විගණකාධිපතිවරයා වෙත ද ඉදිරිපත් කළ යුත්තේ ය.

(6) මෙම වගන්තියේ කාර්ය සඳහා "සුදුසුකම් ලත් විගණකවරයා" යන යෙදුමෙන් —

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු ද වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ

අදහස් වේ.

(7). විගණකාධිපතිවරයා විසින් ස්වකීය වාර්තාව මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

වාර්තා පාර්ලිමේන්තුවේදී සභාගත කළ යුතු බව.

11. මණ්ඩලයේ වැඩ කටයුතු පිළිබඳ වාර්තාවක් මණ්ඩලය විසින් වාර්ෂිකව පිළියෙල කොට, ඒ වාර්තාව විගණකාධිපතිවරයාගේ වාර්තාව ද සමග, ඒ වාර්තා අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂය ඉකුත්වීමට පෙර, මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින් ඒ වාර්තා පාර්ලිමේන්තුවේ දී සභාගත කරනු ලැබිය යුතු ය.

අමාත්‍යවාරයාගේ විධාන.

11 අ මේ පනත යටතේ මණ්ඩලයේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කල මණ්ඩලයට ලිඛිතව පොදු හෝ විශේෂ විධාන දෙනු ලැබිය හැකි අතර මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කල යුතු ය.

1982 අංක 3 දරන පනතින් සංශෝධනය කර ඇත.

ඒකාබද්ධ අරමුදලින් මණ්ඩලයට ගෙවීම.

12 (1) (අ) මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් ආරම්භ වන මාස දොළහේ කාලය තුළ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා මණ්ඩලය විසින් දරන ලද ප්‍රාග්ධන වියදම් ද ඇතුළුව සියලු වියදම් ; සහ

(ආ මේ උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් කාලය අවසන්වන දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් ආරම්භවන මාස විසි හතරේ කාලය තුළ මේ පනතේ විධිවධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා මණ්ඩලය විසින් දරන ලද සියලු ප්‍රාග්ධන වියදම්

ගෙවීම සඳහා පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලබන මුදල් ඒකාබද්ධ අරමුදලින් මණ්ඩලයට ගෙවනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලබන සෑම මුදලක් ම ආණ්ඩුවෙන් මණ්ඩලයට ලැබෙන ණයක් විය යුතු අතර මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසිවලට අනුකූලව ඒ මුදල ආපසු ගෙවනු ලැබිය යුතු ය.

★
14. මණ්ඩලය විසින්, අරමුදලේ මුදල් ආයෝජනයන්ගෙන් ලබා ගත් ලාභවලින් ලාභාංශ ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර, එකී ලාභාංශ අරමුදලේ එක් එක් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

ලාභාංශ

★ 1982 අංක 03 දරන සංශෝධිත පනත මගින් 13 වගන්තිය ඉවත් කර ඇත

# 11 වන කොටස

## දායක මුදල්

15. (1) සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් සේවානියුක්තයකු සම්බන්ධයෙන් අරමුදලට දායක මුදල් ගෙවීමට මේ පනතේ විධිවිධාන යටතේ ඒ සේවා යෝජකයා පළමුකොට යටත් වන්නා වූ අවස්ථාවක, ඒ සේවානියුක්තයා එවිට අරමුදලේ සාමාජිකයකු විය යුතු අතර, අරමුදලෙහි ඔහුගේ පෞද්ගලික ගිණුමේ බැරට යම් මුදලක් ඇතිතාක් කල් ඔහු නොකඩවා අරමුදලේ සාමාජිකයකුව සිටිය යුතු ය.

අරමුදලේ සාමාජිකත්වය.

(2) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන මගින් හැර අන්‍යාකාරයෙන් නැතහොත් ඒ විධිවිධාන වලට අනුකූලව මිස, අරමුදලෙහි කිසිම සාමාජිකයකුට හෝ ඒ සාමාජිකයා වෙනුවෙන් හිමිකම් පාන වෙනත් තැනැත්තකුට හෝ අරමුදලෙහි මුදල් කෙරෙහි යම් සම්බන්ධතාවක් හෝ එහිලා යම් හිමිකම් පෑමක් හෝ නොතිබිය යුතු ය.

(3) මේ පනතේ මේ කොටසේ විධිවිධාන යටතේ මුදල් කිසිවකට යම් සේවානියුක්තයකු හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු හෝ විසින් නියමිත ආකාරයෙන් හිමිකම් පෑමක් කිරීම, ඒ මුදල් සම්බන්ධයෙන් ඒ සේවානියුක්තයාට ඇති අයිතිවාසිකමට කොන්දේසියක් විය යුතු ය.

16. (1) මේ පනතේ මේ කොටස අදාළ වන සෑම සේවානියුක්තයකුට සේවා යෝජක විසින් ඒ සේවානියුක්තයා තම සේවයෙහි නියුක්ත කරනු ලබන එක් එක් මාසය වෙනුවෙන්, ඒ මාසය ඇතුළත ඒ සේවා යෝජකගේ සේවයෙහි නියුක්ත වීමෙන් ඒ සේවානියුක්තයා උපයන මුළු ඉපයීම්වලින් සියයට තුනකට පමණ වන දායක මුදලක් ඊළඟට එළඹෙන මාසයේ අවසාන දින හෝ එදිනට පෙර ඒ සේවා නියුක්තයා සම්බන්ධයෙන් අරමුදලට ගෙවීමට ඒ සේවා යෝජකයා යටත් විය යුතු ය.

සේවා නියුක්තයකු සම්බන්ධයෙන් සේවායෝජක විසින් ගෙවනු ලබන දායක මුදල්.

(2) මේ වගන්තිය යටතේ සේවා යෝජකයකු විසින් දායක මුදල් ගෙවීමේ වගකීම එකී සේවා නියුක්තිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයෙන් නියම කරන ලද දිනයට ඉක්බිතිව ම පසුව වූ දිනයෙහි ආරම්භ විය යුතු ය.

(3) යම් සේවා නියුක්තයකු සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ ගෙවන ලද යම් දායක මුදලක්, මණ්ඩලය විසින්, අරමුදලේ එකී සේවානියුක්තයාගේ පෞද්ගලික ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

1958 අංක 15 දරන පනත අදාල වන ඇතැම් සේවා යෝජකයන් විසින් ගෙවිය යුතු දායක මුදල්.

17. (1) මේ පනතේ 29 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත අදාළ වන සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ එක් එක් සේවානියුක්තයා සම්බන්ධයෙන් ඒ පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදලට හෝ ඒ පනත යටතේ අනුමත කරන ලද අර්ථසාධක අරමුදලක් වශයෙන් ප්‍රකාශ කරන ලද අර්ථසාධක අරමුදලකට ඒ පනත යටතේ නියම කර ඇති ප්‍රමාණයට වඩාවැඩි ප්‍රතිශතයක් අනුව ගණන් බලනු ලැබූ ප්‍රමාණයක දායක මුදලක් ගෙවීමට ඒ සේවා යෝජක විසින් ඒ පනතේ 11 වන වගන්තියේ විධිවිධාන යටතේ තෝරා ගෙන ඇති අවස්ථාවක ඒ ප්‍රතිශතය -

1982 අංක 03 දරන පනතින් සංශෝධනය කර ඇත.

(අ) ඒ සේවායෝජකයා යටතේ වූ තම සේවානියුක්තියෙන් ඒ සේවානියුක්තයාගේ එක් මාසයක මුළු ඉපයීම්වලින් සියයට තුනකට සමාන වෙතොත් හෝ ඊට වැඩි වෙතොත් ඒ වැඩි ප්‍රතිශතයෙන් සියයට තුනක් සෑම මාසයකදී ම අඩුකර ඒ සියයට තුන මේ පනත යටතේ පිහිටුවන ලද අරමුදලට ප්‍රේෂණය කළ හැකි ය ; තවද ඒ අඩු කිරීමෙන් පසු ඉතිරි වන ප්‍රමාණය සේවක අර්ථසාධක අරමුදලට හෝ අනුමත කරන ලද අර්ථසාධක අරමුදලට ගෙවීම කරගෙන යා හැකිය ; නැතහොත්

(ආ) ඒ සේවායෝජකයා යටතේ වූ තම සේවානියුක්තියෙන් ඒ සේවානියුක්තයාගේ එක් මාසයක මුළු ඉපයීම්වලින් සියයට තුනකට අඩු වෙතොත් එම පනතේ 10 වන වගන්තියේ නියමිත ප්‍රතිශතයට වැඩියෙන් ඇති මුදල් ප්‍රමාණය සහ, ඒ සමග, ඒ ඉපයම්වලින් සියයට තුනක මුළු එකතුවක් සෑදෙන පරිදි ඒ සේවායෝජකයා විසින් දෙනු ලබන්නාවූ අතිරේක දායක මුදලක් ඒ සේවායෝජකයා විසින්, මේ පනත යටතේ පිහිටුවන ලද අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය හැකි අතර, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ නියමිත ප්‍රමාණය සේවක අර්ථසාධක අරමුදලට හෝ අනුමත කරන ලද අර්ථසාධක අරමුදලට ගෙවීම දිගටම කර ගෙන යා හැකි ය.

(2 ) මේ පනත යටතේ පිහිටුවන ලද අරමුදලට (1) වන උපවගන්තිය ප්‍රකාර සේවායෝජකයකු විසින් කරන ලද යම් ගෙවීමක් 16 වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතු ය.★

ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු විසින් අරමුදලේ සාමාජිකයකු වීමට ඇති තම කැමැත්ත මණ්ඩලය වෙත දැනුම් දිය යුතු බව.

18. අරමුදලේ සාමාජිකයකු වීමට අදහස් කරන ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු හෝ සංක්‍රමණික කම්කරුවකු විසින් එවැනි සාමාජිකයකු වීමට ඇති තම කැමැත්ත මණ්ඩලය වෙත යවන ලද ලිඛිත දැන්වීමකින් දැන්විය යුතු ය.

1988 අංක 47 දරණ පනතින් සංශෝධනය වී ඇත.

18 වන වගන්තිය යටතේ දැන්වීම යවන තැනැත්තාගෙන් වාර වාර්තාවක් කැඳවීමට මණ්ඩලයට ඇති බලය.

19. (1) 18 වන වගන්තියේ විධිවිධාන යටතේ දැන්වීමක් මණ්ඩලය වෙත ලැබෙන අවස්ථාවක, මේ පනතේ කාර්ය සඳහා, තම සේවා නියුක්තිය සම්බන්ධයෙන් විස්තර ඇතුළත් නියමිත ආකෘතියෙන් වූ වාර වාර්තාවක් ඒ විධානයෙහි සඳහන් දිනයට පෙර, මණ්ඩලය වෙත සපයන ලෙස ඒ දැන්වීම යවන යම් තැනැත්තකුට ලිඛිත විධාන කළ හැකි ය. තව ද ඒ තැනැත්තා විසින් ඒ විධානය පිළිපැදිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වාර වාර්තාවක් සපයන යම් තැනැත්තකු විසින්, ඒ වාර වාර්තාවෙහි ඇතුළත් කරුණු රහස්‍ය ලෙස සලකනු ලැබිය යුතු බවට ලිඛිත ඉල්ලීමක් ඒ වාර වාර්තාව සමග යවනු ලැබිය හැකි ය. තව ද එවැනි ඉල්ලීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ තැනැත්තාගෙන් කලින් ලබාගත් කැමැත්ත නොමැතිව වාර වාර්තාවේ ඇතුළත් කරුණු අනාවරණය නොකළ යුතු ය.

(3) මේ පනත හැර යම් ලිඛිත නීතියක විධිවිධාන මගින් හෝ ඒ යටතේ හෝ එවැනි අනාවරණය කිරීමක් හෝ ඉදිරිපත් කිරීමක් හෝ තහනම් කරනු ලැබ ඇති කවර හෝ විටක යම් වාර වාර්තාවක කරුණු අනාවරණය කිරීමට හෝ ඉදිරිපත් කිරීමට හෝ යම් තැනැත්තකුට මේ වගන්තියෙහි ඉහතින් වූ විධිවිධාන කිසිවකින් නියම වෙතැයි නැතහොත් ඉඩ දෙනු ලැබෙතැයි සලකනු නොලැබිය යුතු ය.

---

★ 1982 අංක 03 දරන පනතේ 4 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය 1981 මාර්තු 1 වනදා සිට ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

20. (1) යම් තැනැත්තකු විසින් 18 වන වගන්තියේ විධිවිධාන යටතේ දැන්වීමක් යවනු ලැබ, ඒ තැනැත්තා විසින් 19 වන වගන්තියේ විධිවිධාන යටතේ සපයන ලද වාර වාර්තාව මණ්ඩලය විසින් සලකා බැලීමෙන් පසු, ඒ තැනැත්තා අරමුදලේ සාමාජිකයකු ලෙස මණ්ඩලය විසින් භාරගනු ලබන අවස්ථාවක, ඒ භාර ගැනීම පිළිබඳව ඒ තැනැත්තාට මණ්ඩලය විසින් ලිඛිතව දැනුම් දිය යුතු ය.

ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තන් විසින් දායක මුදල් ගෙවීම.

(2) යම් තැනැත්තකු,(1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අරමුදලේ සාමාජිකයකු වන අවස්ථාවක, ඔහු විසින් එක් එක් මාසය සඳහා, පසුව එළඹෙන මාසයේ අවසාන දිනයේ දී හෝ ඒ දිනයට පෙර රුපියල් විසිපහකට හෝ එහි ගුණිතයකට සමාන මුදලක් වන දායක මුදලක් ගෙවිය යුතු ය. එහෙත් මාසික දායක මුදල ලිත් වර්ෂය තුළදී නොවෙනස්ව පැවතිය යුතු ය;

1988 අංක 47 පනත මගින් සංශෝධනය වී ඇත.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අරමුදලට දායක මුදල ගෙවන යම් තැනැත්තකු, ඔහුගේ ස්වයං රැකියා නියුක්තිය නතර වූයේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය නතරවූයේ හෝ යම් දිනයක දී ද ඒ දින සිට ඒ දායක මුදල් ගෙවීම, මණ්ඩලය වෙත ලිඛිතව දැනුම් දීමෙන් පසු නතර විය යුතු ය.

1988 අංක 47 පනත සංශෝධනය වී ඇත.

(4) (1) වන උපවගන්තිය යටතේ අරමුදලේ සාමාජිකයකු බවට පත්වන තැනැත්තකු විසින් යම් ලිත් වර්ෂයක අනුක්‍රමික මාස තුනක් හෝ ලිත් වර්ෂයක් තුල එකතුව මාස පහක් වන මුළු කාලයක් හෝ දායක මුදල් ගෙවනු නොලැබූ විටක, අරමුදලේ ඒ සාමාජිකයාගේ දායක මුදල් මත ඒ ලිත් වර්ෂය වෙනුවෙන් යම් පොළියක් හෝ ලාභාංශක් ලැබීමට ඔහු හිමිකම් නොලැබිය යුතු ය.

1988 අංක 47 පනත සංශෝධනය වී ඇත.

ප්‍රතිලාභ ගෙවනු ලබන කාලය.

21 (1) අරමුදලේ යම් සාමාජිකයෙකුගේ පුද්ගලික ගිණුමේ බැරට ඇති යම් මුදලක් අරමුදල පිහිටුවීමේ දින සිට අවුරුදු දෙකක් ඉකුත් වනතුරු ගෙවනු නොලැබිය යුතු ය.

1982 අංක 03 පනත මගින් සංශෝධනය වී ඇත.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අවුරුදු දෙකක කාලය ඉකුත් වීමෙන් පසු, යම් සාමාජිකයෙකුගේ පුද්ගලික ගිණුමේ බැරට ඇති මුළු මුදල් ප්‍රමාණය, 23 වන, 24 වන සහ 25 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව ඒ සාමාජිකයාට ගෙවනු ලැබිය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනත යටතේ සියරට යවනු ලබන යම් සාමාජිකයකුගේ පුද්ගලික ගිණුමේ බැරට ඇති මුළු මුදල් ප්‍රමානය ඒ සාමාජිකයා ශ්‍රී ලංකාවෙන් පිටත්වන දිනයට පෙර ඔහුට ගෙවනු ලැබිය යුතුය.

22. අරමුදලේ ආයෝජනයෙන් ලැබෙන ආදායමෙන්, අමාත්‍යාවරයා සහ මුදල් විෂයය භාර අමාත්‍යාවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි, වර්ෂයකට සියයට තුනකට නොඅඩු යම් අනුපාතයක පොලියක්, එකී වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දිනට අරමුදලේ එක් එක් සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබෙන මුදලට එක් එක් වර්ෂය සඳහා ගෙවනු ලැබිය යුතු ය :

දායක මුදල් වලට පොලී ආදිය.

එසේ වුව ද, අරමුදලේ යම් සාමාජිකයකුට හෝ සාමාජිකයකු සම්බන්ධයෙන් මේ පනත යටතේ යම් ප්‍රතිලාභයක් වශයෙන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවනු ලබන ලිත් වර්ෂයේ ජනවාරි මස පළමුවන දිනයෙන් ආරම්භ වී එකී මුදල් ප්‍රමාණය ගෙවන දිනයට කලින් මාසයේ අවසාන දිනයෙන් අවසන් වන කාල සීමාව සඳහා, එකී කාලසීමාව අවසන් වන දිනයේ දී එකී සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබෙන මුදලට වර්ෂයකට සියයට තුනක අනුපාතයක පොළියක් ගෙවනු ලැබිය යුතු ය.

1988 අංක 47 පනත මගින් සංශෝධනය වී ඇත.

සේවා නියුක්තිය අවසන් කළ විට සේවා නියුක්තයන්ට ප්‍රතිලාභ ගෙවීම.

23. (1) 24 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ස්වකීය පෞද්ගලික ගිණුමෙහි යම් සේවා නියුක්තයකුගේ බැරට තිබෙන මුදල, ඔහුගේ සේවා නියුක්තිය අවසන් කරනු ලැබූ විට, මණ්ඩලය විසින් ඒ සේවා නියුක්තයාට ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද අරමුදලේ සාමාජිකයකුගේ පෞද්ගලික ගිණුමෙහි ඔහුගේ බැරට තිබෙන යම් මුදලක් —

(අ) ඒ සාමාජිකයා වයස අවුරුදු හැටට වැඩි වන්නාවූ අවස්ථාවක හැර ; නැතහොත්

(ආ) ශ්‍රී ලංකාවට ආපසු නොපැමිණීමේ චේතනාවෙන් හෝ විදේශයක ස්ථිර පදිංචිය සඳහා හෝ ශ්‍රී ලංකාවෙන් පිටවී යාමට සිටින බවට ඒ සාමාජිකයා විසින් ලේඛනමය සාක්ෂි මගින් මණ්ඩලය සෑහීමකට පත් කරනු ලබන අවස්ථාවක හැර,

අවුරුදු පහක කාල සීමාවක් ඇතුලත එක් වරකට වැඩියෙන් ආපසු ලබා ගැනීමට ඒ සාමාජිකයා හිමිකම් නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ කුමක් සඳහන් ව තිබුනිද මේ පනත අදාළ වන සේවානියුක්තයකු —

(i) රජයේ සෙවයෙහි ;

(ii) 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත මගින් සංස්ථාපනය කරන ලද පළාත් පාලන සේවයෙහි ;

(iii) 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ 47 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දිසා සේවාවෙහි ; හෝ

(iv) පළාත් පාලන සේවයේ සාමාජිකයකු වශයෙන් හැර යම් පළාත් පාලන ආයතනයක සේවයෙහි

විශ්‍රාම වැටුප් සහිත සේවා නියුක්තියක් භාරගත් අවස්ථාවක, ඒ විශ්‍රාම වැටුප් සහිත පත්වීම භාරගත් දින දී ඒ සේවා නියුක්තයාගේ පෞද්ගලික ගිණුමේ ඔහුගේ බැරට තිබුණු මුදල මණ්ඩලය විසින් ඒ සේවා නියුක්තයාට ගෙවනු ලැබිය යුතු ය.

එසේ වුවද (ii) වන සහ (iv) වන ඡේදවල සඳහන් යම් සේවයක සේවා නියුක්තයකු විසින් දරනු ලැබූ විශ්‍රාම වැටුප් රහිත තනතුරක්, පසුව, ඒ විශ්‍රාම වැටුප් රහිත තනතුරෙහි ඔහු ප්‍රථම වරට සේවා නියුක්තියෙහි යොදවනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් සහිත බවට පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ තනතුර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බවට පත් කරනු ලැබූ දිනයේ දී අරමුදලේ ඒ සේවා නියුක්තයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබූණු දායක මුදල් ප්‍රමාණය, ඔහුගේ සේවායෝජක වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය. 1993 අංක 18 දරන පනතින් සංශෝධනය කර ඇත

අශක්නුතාවක් නිසා සේවා නියුක්තිය අවසන් කරනු ලැබූ විට ප්‍රතිලාභ ගෙවීම.

24. (1) හදිසි අනතුරක් හෝ අසනීපයක් හේතුකොට ගෙන වූ අශක්නුතාව මත යම් සේවානියුක්තයකුගේ සේවානියුක්තිය අවසන් කරනු ලැබූ අවස්ථාවක, 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ඒ සේවානියුක්තයාගේ පෞද්ගලික ගිණුමෙහි බැරට තිබෙන මුදල මණ්ඩලය විසින් ඒ සේවානියුක්තයාට ගෙවනු ලැබිය යුතු ය. 1988 අංක 47 දරන පනතින් සංශෝධනය කර ඇත

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා "අශක්නුතාව මත අවසන් කරනු ලැබූ" යන්නෙන් වැඩ කිරීම සඳහා ස්ථිර හා සම්පූර්ණ අශක්නුතාවයක හේතුවෙන් සේවා නියුක්තය අවසන් කිරීම සහ ඒ හේතුව නිසා තවදුරටත් වැඩ කිරීම සඳහා නුසුදුසු බවට ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු සහතික කිරීම අදහස් වේ.

(3) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ සේවා නියුක්තකයකු විසින් ඉදිරිපත් කරන ලද වෛද්‍ය සහතිකයක නිර්ව්‍යාජත්වය පිළිබඳව සැක කිරීමට මණ්ඩලයේ සභාපතිවරයාට හේතු ඇති විට, ඔහු විසින් ඒ සේවා නියුක්තයා යථා පරිදි සංයුක්ත කරන ලද වෛද්‍ය මණ්ඩලයක් හෝ ආණ්ඩුවේ වෛද්‍ය නිලධරයකු හෝ විසින් නැවත පරීක්ෂා කරනු ලැබීම සඳහා යොමු කරනු ලැබිය හැකි අතර, එසේ නැවත පරීක්ෂා කිරීමේදී, මුල් වෛද්‍ය සහතිකය, යම් වැදගත් විස්තරයක් සම්බන්ධයෙන් අසත්‍ය බව සොයා ගනු ලැබූ අවස්ථාවක මණ්ඩලය විසින් ඒ සහතිකය ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය. තවද ඒ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයා විසින් ඉන් පසුව නිකුත් කරන වෛද්‍ය සහතික පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමට මණ්ඩලයට හිමිකම තිබිය යුතු ය.

1988 අංක 47 පනත මගින් සංශෝධනය වී ඇත.

සේවා නියුක්තයකු මියගිය විට ප්‍රතිලාභ ගෙවීම.

25. (1) යම් සේවානියුක්තයකු මිය ගිය විට, ස්වකීය පෞද්ගලික ගිණුමෙහි ඔහුගේ බැරට තිබෙන මුදල ඒ සේවා නියුක්තයා ගේ නාමිකයාට මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු ය. එසේ නාමිකයකු නොමැති නම්, ඒ සේවානියුක්තයාගේ අන්තිම කැමති පත්‍රයේ පොල්මෑකරුට හෝ ඒ සේවානියුක්තයාගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරුට හෝ ඒ සේවානියුක්තයාගේ උරුමක්කාරයින්ට හෝ ඒ මුදල ගෙවනු ලැබිය යුතු ය.

(2) සාමාජිකයකුගේ පෞද්ගලික ගිණුමෙහි තම බැරට තිබෙන මුදලට හිමිකම ලැබීමට පෙර, අරමුදලේ සාමාජිකයකු මිය යන අවස්ථාවක නැතහොත් ඊට හිමිකම ලැබීමෙන් පසු එහෙත් ඒ මුදල භාර ගැනීමට පෙර ඔහු මිය යන අවස්ථාවක සහ ඒ සාමාජිකයාගේ මරණය සිදුවූ විට, ඒ මුදල ගෙවිය යුතු වූ කිසිදු නාමිකයකු මේ පනත යටතේ සාදන ලද නියෝග යටතේ පත්කර නොමැති අවස්ථාවක නැතහොත් මේ පනත යටතේ සාදන ලද නියෝග යටතේ පත් කරන ලද නාමිකයා හෝ නාමිකයන් මිය ගොස් ඇති අවස්ථාවක, එවිට ඒ මුදල ——

(අ) එය අද්මිනිස්ත්‍රාසි කළ හැකි බූදලයක් නම් අන්තිම කැමති පත්‍රයේ පොල්මෑකරුට හෝ ඒ බූදලයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ඒ මිය ගිය සාමාජිකයාගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරුට හෝ ගෙවනු ලැබිය යුතු ය ;

(ආ) එය අද්මිනිස්ත්‍රාසි කළ නොහැකි බූදලයක් නම්, මණ්ඩලයේ මතය අනුව සහතික කරනු ලැබිය යුතු තැනැත්තන් අතරින් මණ්ඩලය විසින් පත් කරනු ලබන හෝ ලැබිය යුතු ඒ මුදලට නීතියෙන් හිමිකම ඇති තැනැත්තාට ගෙවනු ලැබිය යුතු ය ; තවද

(ඇ) අරමුදලේ සාමාජිකයකු විසින් ඒ සාමාජිකයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබෙන මුදල ඔහුගේ මරණය සිදුවූ විට ගෙවිය යුතු නාමිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් පත් කරනු ලැබ ඇති අවස්ථාවක, සහ ඒ සාමාජිකයාට පෙර එක් නාමිකයකු හෝ එක් නාමිකයකුට වැඩි ගණනක් මිය යන අවස්ථාවක එවිට ඒ සාමාජිකයා විසින් අවස්ථාවෝචිත පරිදි අලුත් නාමිකයකු හෝ නාමිකයන් පත් නොකොට ඒ සාමාජිකයාගේ මරණය සිදු වූ විට ඒ මුදල —

(i) ජීවත්ව සිටින එකම නාමිකයකු සිටින්නේ නම් ඔහුට ගෙවනු ලැබිය යුතු ය ; නැතහොත්

(ii) එක් නාමිකයකුට වැඩියෙන් සිටින්නේ නම් ඒ නාමිකයන් අතර සමාන කොටස් අනුව බෙදීමෙන් ගෙවනු ලැබිය යුතු ය.

(3) යම් අවස්ථාවකදී අරමුදලේ සාමාජිකයකු විසින් ඔහුගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබෙන මුදල ඔහුගේ මරණය සිදු වූ විට ගෙවිය හැකි යම් තැනැත්තකු හෝ තැනැත්තන් නම් කල හැකි ය.

(3අ) මේ පනතේ විධිවිධාන යටතේ නාමිකයකු නම් කොට නොමැති අවස්ථාවක, ඒ සාමාජිකයා සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවනු ලැබූ සේවක අර්ථසාධක අරමුදලේ හෝ ඒ පනත යටතේ අනුමත කරනු ලැබූ අර්ථසාධක අරමුදලක හෝ සාමාජිකයකු ද වේ නම්, ඒ පනත යටතේ සාදනු ලැබූ නියෝග යටතේ නම් කරනු ලැබූ යම් නාමිකයකු, මේ පනත යටතේ නම් කරනු ලැබූ නාමිකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ විධිවිධාන, අවශය වෙනස් කිරීම් සහිතව, ඒ නාමිකයා සම්බන්ධයෙන් ද අදාළ වන්නේ ය.

1993 අංක 18 දරන පනතින් සංශෝධනය වී ඇත.

(4) අරමුදලේ සාමාජිකයකු විසින් කරන ලද යම් නම් කිරීමක් තමා විසින් කවර අවස්ථාවක දී වුව ද අවලංගු කළ හැකි ය.

(5) සෑම නම් කිරීමක් ම සහ නම් කිරීමක සෑම අවලංගු කිරීමක් ම නියමිත ආකෘතියෙහි විය යුතු ය.

(6) යම් සාමාජිකයකු විසින් කරන ලද සෑම නම් කිරීමේ ලේඛනයක් ම සහ නම් කිරීම අවලංගු කිරීමේ සෑම ලේඛනයක් ම ඒ ලේඛනය ලියා අත්සන් කිරීමේ දින සිට දින තිහක් ඇතුළත තම සේවා යෝජක මගින් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(7) තම විවාහයට පෙර සාමාජිකයකු විසින් කරන ලද යම් නම් කිරීමක් ඒ සාමාජිකයාගේ විවාහයේ දී අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) විවාහක සාමාජිකයකු විසින් කරන ලද සෑම නම් කිරීමක් ම ඔහුගේ පවුලේ එක් සාමාජිකයකුගේ හෝ ඊට වැඩි සාමාජිකයන් ගණනකගේ වාසියට විය යුතු ය.

# 111 වන කොටස

## හිමිකම් පෑම් පරිපාලනය කිරීම හා නිශ්චය කිරීම

අඩු කල දායක මුදල් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් සේවායෝජකයන්ට විධාන නිකුත් කළ යුතු බව.

26. (1) මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ම පැවති එක් වර්ෂයක කාලය තුළ හෝ ඒ දිනයෙහි හෝ ඊට පසු යම් කාලයක මේ පනත යටතේ ගෙවිය යුතු යම් දායක මුදලක ප්‍රමාණය අඩු කිරීමේ කාර්යය සඳහා යම් සේවානියුක්තයකුගේ සේවායෝජක විසින් ඒ සේවානියුක්තයාගේ ඉපැයීම් අඩු කරනු ලැබ ඇති බවට මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක, අඩු කිරීමට පෙර ඒ සේවානියුක්තයා ලැබූ ඉපැයීම් පදනම් කරගෙන ආගණනය කරන ලද නම්, ඒ කාලය තුළ දායක මුදල් වශයෙන් සේවායෝජක විසින් ගෙවිය යුතු මුදල සහ ඒ කාලය තුළ ඔහු විසින් ඇත්ත වශයෙන්ම දායක මුදල් වශයෙන් ගෙවනු ලැබූ මුදල අතර ඇති වෙනස, ඒ අඩු කරන ලද ඉපැයීම් ඒ සේවානියුක්තයා ලැබූ සම්පූර්ණ කාලය සම්බන්ධයෙන් දැන්වීමේ සඳහන් වාරිකවලින් සහ එහි සඳහන් දිනවලට පෙර අරමුදලට ගෙවන ලෙස මණ්ඩලය විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ සේවායෝජකයාට විධාන කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය යටතේ යම් සේවායෝජකයකු වෙත විධානයක් කරනු ලබන අවස්ථාවක එකී සේවායෝජක විසින් ඒ විධානයට අනුකූලව ක්‍රියා කල යුතු ය.

යම් දායක මුදල් ගෙවනු නොලැබූ අවස්ථාවක සේවායෝජක විසින් අධිභාරය ගෙවිය යුතු බව.

27. මේ පනත යටතේ ගෙවිය යුතු යම් දායක මුදලක් නියමිත දින අරමුදලට ගෙවනු නොලැබ ඇත්තා වූ ද තමාට පාලනය කළ නොහැකි වූ හේතු නිසා ඒ දායක මුදල් ගෙවීමට අපොහොසත් වූ බවට මණ්ඩලය සෑහීමට පත්වන අයුරින් පැහැදිලි කිරීමට සේවායෝජකට නොහැකි වන්නා වූ ද අවස්ථාවක, ඒ දායක මුදල් ප්‍රමාණයට අතිරේකව පහත සඳහන් ආකාරයට ආගණනය කරන ලද අධිභාර මුදල් ප්‍රමාණයක් අරමුදලට ගෙවීමට ඔහු යටත් විය යුතු ය :—

1982 අංක 03 පනතින් සංශෝධනය වී ඇත.

(අ) ඒ දායක මුදල දින දහයක් නොඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක ඒ දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පහක අධිභාරයක් ;

(ආ) ඒ දායක මුදල දින දහයක් ඉක්මවන, එහෙත් එක් මාසයක් නොඉක්මවන, කාලයකට හිඟව ඇති අවස්ථාවක ඒ දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පහළොවක අධිභාරයක් ;

(ඇ) ඒ දායක මුදල එක් මාසයක් ඉක්මවන, එහෙත් මාස තුනක් නොඉක්මවන, කාලයකට හිඟව ඇති අවස්ථාවක ඒ දායක මුදල් ප්‍රමාණයෙන් සියයට විස්සක අධිභාරයක් ;

(ඈ) ඒ දායක මුදල මාස තුනක් ඉක්මවන, එහෙත් මාස හයක් නොඉක්මවන, කාලයකට හිඟව ඇති අවස්ථාවක ඒ දායක මුදල් ප්‍රමාණයෙන් සියයට තිහක අධිභාරයක් ;

(ඉ) ඒ දායක මුදල මාස හයක් ඉක්මවන, එහෙත් මාස දොළහක් නොඉක්මවන, කාලයකට හිඟව ඇති අවස්ථාවක ඒ දායක මුදල් ප්‍රමාණයෙන් සියයට හතළිහක අධිභාරයක් ;

(ඊ) ඒ දායක මුදල මාස දොළහක් ඉක්මවන කාලයකට හිඟව ඇති අවස්ථාවක ඒ දායක මුදල් ප්‍රමාණයෙන් සියයට පනහක අධිභාරයක් .

28 (1) අරමුදලට අය විය යුතු යම් මුදලක් ලඝු කාර්ය පටිපාටිය අනුව නඩු කටයුතු පවරනු ලැබිය හැකි නඩුවක් මගින් අය කරනු ලැබිය යුතු ය. ලඝු නඩු කාර්ය පටිපාටිය අදාළ වන්නේ යම් නඩු සම්බන්ධයෙන් ද, ඒ නඩුවලට අදාළ සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන මේ වගන්තිය යටතේ වූ නඩුවකට අදාළ විය යුතු ය. තවද එවැනි නඩුවකට ඒ විධිවිධාන අදාළ කිරීමේ කාර්ය සඳහා පමණක් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 8 වන වගන්තියෙහි දැක්වෙන "මේ ආඥාපනතින්" යන වචන වෙනුවට "මේ ආඥාපනතින් හෝ වෙනත් ලිඛිත නීතියකින් " යන වචන ආදේශ කරනු ලැබූවාක් මෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 8 වන වගන්තියෙහි විධිවිධාන බලාත්මක විය යුතු ය.

අරමුදලට අය විය යුතුමුදල් අයකර ගන්නා අන්දම.

(2) මේ පනත යටතේ තමා විසින් ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම සේවායෝජකයකු විසින් පැහැර හරින හා (1) වන උපවගන්තිය යටතේ අයකර ගැනීම ක්‍රියාත්මක කළ නොහැකි හා අවස්ථානුකූල නොවන බව මණ්ඩලයේ මතය වන අවස්ථාවක, මණ්ඩලය විසින් පැහැර හැරීම සිදු කර ඇත්තේ යම් සේවානියුක්තයකු සම්බන්ධයෙන් ද ඔහු ඒ පැහැර හැරි සේවායෝජකයා විසින් සේවයේ නියුක්ත කරනු ලබන හෝ සේවයේ නියුක්ත කරනු ලැබූ යම් දිස්ත්‍රික්කයක අධිකරණ බලසීමාව ඇති දිසා අධිකරණය වෙත, ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් පිළිබඳ විස්තර හා එකී සේවායෝජක පදිංචි ස්ථානයේ නම හා ස්ථානය ඇතුළත් සහතිකයක් නිකුත් කළ හැකිය. තවද ඉන් අනතුරුව පැහැර හැරි සේවායෝජකගේ සියලු චංචල හා නිශ්චල දේපළ හෝ එසේ අය විය යුතු මුදල් ප්‍රමාණය අය කර ගැනීම සඳහා අවශ්‍ය යයි පිස්කල් විසින් සැලකිය හැකි එහි කොටසක්, තහනමට ගෙන විකිණීම සඳහා ඒ පිස්කල්ට බලයපවරමින් හා නියම කරමින් ක්‍රියාත්මක කිරීමේ ආඥාවක් ඒ පිස්කල් වෙත නිකුත් කිරීමට අධිකරණය විසින් විධාන කළ යුතු අතර, ඒ තහනමට ගැනීම හා විකිණීම හා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව සිවිල් නඩුවිධාන සංග්‍රහයේ 226 සිට 297 දක්වා වගන්ති අදාළ වන්නේ ය.

1988 අංක 47 පනතින් සංශෝධනය වී ඇත.

(3) මේ පනත යටතේ සේවායෝජකයා විසින් ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් ගෙවීම පැහැර හරින හා (1) වන හෝ (2) වන උපවගන්තිය යටතේ ඒ මුදල් ප්‍රමාණය අයකර ගැනීම ක්‍රියාත්මක කළ නොහැකි හා අවස්ථානුකූල නොවන බව මණ්ඩලයේ මතය වන අවස්ථාවක නැතහොත් අයවිය යුතු මුළු මුදල් ප්‍රමාණය තහනමට ගැනීම හා විකිණීම මගින් අයකර නොගන්නා ලද අවස්ථාවක, මණ්ඩලය විසින් පැහැර හැරීම සිදුකර ඇත්තේ යම් සේවානියුක්තයකු සම්බන්ධයෙන් ද, ඔහුගේ සේවා ස්ථානය පිහිටා ඇති කොට්ඨාසය කෙරෙහි අධිකරණ බල සීමාව ඇති මහේස්ත්‍රාත්වරයකු වෙත එසේ අය විය යුතු මුදල් ප්‍රමාණය හා පැහැර හැරි සේවායෝජකගේ නම හා පදිංචි ස්ථානය පිළිබඳ විස්තර ඇතුළත් සහතිකයක් නිකුත් කළ හැකි ය. ඉන් අනතුරුව මහේස්ත්‍රාත්වරයා විසින් මේ පනත යටතේ අයවිය යුතු මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා ඔහුට විරුද්ධව තවදුරටත් නඩු කටයුතු නොගෙන යාමට හේතු දැක්වීමට ඒ සේවායෝජක ඔහු ඉදිරියට කැඳවිය යුතු අතර එසේ ප්‍රමාණවත් හේතු දැක්වීම පැහැර හැරියවිට ඒ මුදල් ප්‍රමාණය මහේස්ත්‍රාත්වරයා විසින් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදක් සඳහා දණ්ඩන නියමයක් මගින් ඒ සේවායෝජක වෙත නියම කරන ලද දඩයක් ලෙස සලකනු ලැබිය යුතු ය. තවද එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ විධිවිධාන (එහි (1) වන උපවගන්තියේ (අ), (ඊ), (ඒ) ඡේද හැර) අදාළ විය යුතු ය; තව ද එවැනි දණ්ඩන නියමයක් කරන අවස්ථාවේ දී ඒ වගන්තියේ විධිවිධාන මගින් තමා විසින් කළ හැකිව තිබූ යම් විධාන මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකි ය.

1988 අංක 47 දරණ පනතින් සංශෝධනය වී ඇත.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා මණ්ඩලය විසින් නිකුත් කරන ලද සහතිකයක යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය මේ වගන්තිය යටතේ යම් නඩු කටයුත්තක දී අධිකරණයක් විසින් ප්‍රශ්න කරනු ලැබීම හෝ විභාග කරනු ලැබීම හෝ නොකළ යුතු ය. තවද ඒ අනුව මේ වගන්තියේ කිසිවකින් ඒ සහතිකයේ යම් ප්‍රකාශයක නිරවද්‍යතාවය පිළිබඳව සලකා බැලීමට හෝ තීරණය කිරීමට හෝ අධිකරණයට බලය නොලැබෙන්නේ ය. තවද මේ පනත යටතේ ගෙවීම පැහැර හරින සේවායෝජකයකුගෙන් ලැබිය යුතු මුදල, නිසි ලෙස ගණන් බලනු ලැබූ බව සහ ඒ මුදල පැහැර හරිනු ලැබ ඇති බවට මණ්ඩලයේ සහතිකය ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

(5) අරමුදලට ලැබිය යුතු යම් මුදල් අය කර ගැනීම සඳහා නඩු කටයුතු මණ්ඩලය විසින් හෝ ඒ වෙනුවෙන් බලය දෙන ලද මණ්ඩලයේ යම් නිලධරයකු විසින් හෝ පවරනු ලැබිය හැකි ය. තවද ඊට පටහැනිව වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇතද මණ්ඩලය විසින් හෝ ඒ නිලධරයා විසින් හෝ ඒ නඩු කටයුතු පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(6) මේ පනත යටතේ දායක මුදල් හෝ අධිභාරයක් වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් අය කර ගැනීමට කාලාපගමන ආඥාපනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

දායක මුදල් ගෙවීම පිණිස සේවායෝජක විසින් සේවා නියුක්තයකුගේ ඉපැයීම් අඩු නොකළ යුතු බව.

29. මේ පනත යටතේ යම් සේවානියුක්තයකු සම්බන්ධයෙන් යම් දායක මුදලක් හෝ අධිභාරයක් ගෙවීමට තමාට ඇති බැඳීම හේතු කොට ගෙන කිසිම සේවායෝජකයකු විසින්, ඒ සේවානියුක්තයාගේ ඉපැයීම් අඩු කිරීම හෝ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ හෝ තම සේවානියුක්තියේ නියමයන් හා කොන්දේසි යටතේ හෝ ඒ සේවානියුක්තයා හිමිකම ලබන යම් ප්‍රතිලාභයක් ඔහුට හානිකර අන්දමින් වෙනස් කිරීම හෝ නොකළ යුතු ය.

සේවායෝජක විසින් ගෙවිය යුතු යම් මුදලක් ඔහු විසින් අඩු නොකළ යුතු බව.

30. මේ පනතේ මේ කොටසෙහි විධිවිධාන යටතේ දායක මුදලක් හෝ අධිභාරයක් හෝ වශයෙන් යම් සේවානියුක්තයකුගේ සේවායෝජක විසින් ගෙවිය යුතු යම් මුදලක් ඒ සේවායෝජක විසින් ඒ සේවා නියුක්තයාගේ ඉපැයිම්වලින් අඩු නොකරනු ලැබිය යුතු ය.

යම් සේවායෝජකයකු ගෙන් අයවිය යුතු මුදල් පළමු වැය බරක් විය යුතු බව.

31. සේවායෝජකයකු විසින් යම් මුදලක් ගෙවනු ලැබිය යුතු ලෙස මේ කොටසින් නියම කරනු ලැබ ඇත්තේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය අවසන් වීමෙන් ඉක්බිතිව ම එළඹෙන කාලයේ දී ඒ සේවායෝජකයාගෙන් අයවිය යුතු ඒ මුදල, වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද ඔහුගේ වත්කම් පිළිබඳව පළමු වැය බරක් විය යුතු ය.

සේවානියුක්තයාගේ බැරට ඇති මුදල් පැවරීම බල රහිත බව.

32. අරමුදලේ සාමාජිකයකුගේ පෞද්ගලික ගිණුමේ බැරට ඇති මුදලක සෑම පැවරීමක් හෝ අය කිරීමක් සහ එවැනි යම් මුදලක් පැවරීම හෝ අයකිරීම පිළිබඳ වූ සෑම ගිවිසුමක් ම වස්තුභංගත්ව ආඥාපනතේ සඳහන් විධිවිධාන කෙසේ වුවද, ඒ සාමාජිකයාගේ ණය හිමියන් වෙනුවෙන් ක්‍රියා කරන යම් පැවරුම්ලාභියකුට අත් නොවිය යුතු ය.

හිමිකම් පෑම්, මණ්ඩලය විසින්හෝ මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ නිශ්චය කල යුතු බව.

33. (1) අරමුදලෙන් යම් ගෙවීමක් සඳහා වන සියලු හිමිකම් පෑම්, හෝ තත් කාර්යය සඳහා මණ්ඩලය බලය දෙන ලද යම් නිලධරයකු විසින් හෝ නිශ්චය කරනු ලැබිය යුතු අතර, මණ්ඩලයේ හෝ එවැනි නිලධරයකුගේ හෝ නිශ්චය කිරීම්, ඊට විරුද්ධව කරන අභියාචනයකදී දෙනු ලැබිය හැකි තීරණයකට යටත්ව, අවසනාත්මක විය යුතු ය.

1988 අංක 47 දරන පනතින් සංශෝධනය වී ඇත.

(2) මණ්ඩලයේ නිලධරයකු විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නිශ්චයකින් අතෘප්ප කවර හෝ තැනැත්තකුට ඒ නිශ්චය කිරීම දන්වනු ලැබීමෙන් දවස් තිහක් ඇතුළත ඒ තැනැත්තා විසින් ඊට විරුද්ධව මණ්ඩලය වෙත අභියාචනයක් කළ හැකි ය. යම් අභියාචනයක දී මණ්ඩලය විසින් ඒ නිලධරයාගේ නිශ්චය කිරීම, ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ උත්සාරණය කිරීම කළ හැකි අතර එවැනි යම් අභියාචනයක දී මණ්ඩලයේ තීරණය 34 වන වගන්තියේ (1) වන උපවගන්තියේ කාර්ය සඳහා මණ්ඩලයේ නිශ්චය කිරීමක් ලෙස සැලකිය යුතු ය.

මණ්ඩලයේ නියමයට විරුද්ධව අභියාචනය.

34. (1) මණ්ඩලයේ නිශ්චය කිරීම සම්බන්ධයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් නීතිය පිළිබඳ ප්‍රශ්නයක් මත ඒ නිශ්චය කිරීමට විරුද්ධව අභියාචනයේ වෙනත් සෑම පාර්ශවකරුවකු ම වගඋත්තරකරුවකු වශයෙන් සඳහන් කරනු ලබන ලිඛිත පෙත්සමක් මගින් අභියාචනාධිකරණයට අභියාචන කරනු ලැබිය හැකි ය.

(2) විවාදයට භාජන කරනු ලබන නීතිය පිළිබඳ ප්‍රශ්නය අභියාචන පෙත්සමෙහි සඳහන් විය යුතු අතර, ඒ ප්‍රශ්නය අභියාචනාධිකරණය විසින් විනිශ්චය කරනු ලැබීමට සුදුසු වූ ප්‍රශ්නයක් බවට නීතිඥවරයකු විසින් දෙනු ලබන සහතිකයක් ද එයට ඇතුළත් විය යුතු ය.

(3) අභියාචන පෙත්සම, අභියාචකට නිශ්චය කිරීම දැනුම් දෙනු ලැබීමෙන්, දින තිහක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. 33 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සහ මේ වගන්තියේ කාර්ය සඳහා, යම් තැනැත්තකුට නිශ්චය කිරීම දැනුම් දෙනු ලැබූ දිනය ලෙස සැලකිය යුත්තේ ඒ නිශ්චය කිරීම ඒ තැනැත්තාට ලියාපදිංචි තැපැල් මගින් තැපැල් කරනු ලැබූ දිනය ය.

1988 අංක 47 දරන පනතින් සංශෝධනය වී ඇත.

35. අරමුදල පරිපාලනය කිරීම සම්බන්ධයෙන් වූ සියලු ලේඛන, ආකෘති පත්‍ර හා වාර වාර්තා නියම කරනු ලැබිය යුතු ය.

ලේඛන, ආකෘති පත්‍ර හා වාර වාර්තා.

## IV වන කොටස

## මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

නිලධරයන් හා සේවකයන් පත් කිරීම

36. (1) ස්වකීය කර්තව්‍යයන් කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍යයයි මණ්ඩලය විසින් සලකනු ලබන්නා වූ නිලධරයන් හා සේවකයන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ නිලධරයන් ට හා සේවකයන් ට මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයෙන් හා අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලට ද ඔවුන් යටත් විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු, මණ්ඩලයේ ඉල්ලීම පිට ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනි කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාල සීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතෙහි 13 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රාජ්‍ය සේවයේ නියක්ත යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාල සීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි යොදවා ගනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාල සීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) මණ්ඩලයේ ඉල්ලීම පිට පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ක ඇතිව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාල සීමාවක් සඳහා, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත්, අවස්ථාවෝචිත පරිදි, විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියමයන් හා කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය හා පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ ඒ පළාත් පාලන ආයතනය විසින් ගිවිස ගනු ලැබිය හැකි විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියමයන් හා කොන්දේසි පිට මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියමයන් හා කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය සහ එකී රාජ්‍ය සංස්ථාව විසින් ගිවිස ගනු ලැබිය හැකි විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියමයන් හා කොන්දේසි පිට මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(9) (7) වන උපවගන්තිය හෝ (8) වන උපවගන්තිය අනුව යම් තැනැත්තකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා යටත්විය යුතු ය.

## V වන කොටස

## විවිධ කරුණු

මණ්ඩලය විසින් හෝ එය විසින් බලය දෙනු ලැබූ නිලධරයකු විසින් සේවායෝජකට විධාන නිකුත් කල හැකි බව

37. මණ්ඩලය විසින් හෝ එය විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ විධානයක් කිරීමෙන් ඒ විධානයෙහි සඳහන් කරනු ලබන දිනයකට පෙර මණ්ඩලය හෝ ඒ නිලධරයා වෙත ——

(අ) ඒ විධානයෙහි සඳහන් කරනු ලබන ඒ සේවායෝජකගේ සියලු සේවානියුක්තයන් හෝ යම් සේවානියුක්තයකු සම්බන්ධයෙන් විස්තර ඇතුළත් වාර වාර්තාවක් ;

(ආ) ඒ සේවායෝජක විසින් සපයනු ලැබූ යම් වාර වාර්තාවක ඇතුලත් යම් විස්තර සම්බන්ධයෙන් ඒ විධානයෙහි සඳහන් කරනු ලබන යම් තොරතුරක් හෝ පැහැදිලි කිරීමක් ; සහ

(ඇ) ඒ සේවායෝජක විසින් තබාගත යුතු බවට මේ පනතින් හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ නියම කරනු ලැබූ යම් ලේඛනයක නැතහොත් වාර්තාවක සත්‍ය පිටපතක් හෝ උධෘතයක් හෝ ඒ ලේඛනයේ නැතහොත් වාර්තාවේ යම් කොටසක් — 1988 අංක 47 දරන පනතින් සංශෝධනය වී ඇත.

සපයන ලෙස සේවායෝජකයකුට විධාන කරනු ලැබිය හැකි ය.

පැහැරහැරි සේවායෝජකයන් විෂයයෙහි අධිභාරයක් පැනවීම

37 අ දායක මුදල් වලට අදාළ වාර වාර්තාවක් සපයන ලෙස මේ පනතින් හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයකින් හෝ මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ යම් විධානයකින් නියම කරනු ලැබූ, සේවා යෝජකයකු, එකී පනතේ, නියෝගයේ හෝ විධානයේ සඳහන් කාලසීමාව ඇතුළත ඒ වාර්තාව සැපයීම පැහැර හැරියහොත් හෝ සාවද්‍ය හෝ අසම්පූර්ණ වාර්තාවක් සැපයුවහොත් සහ එකී කාල සීමාව ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, ඒ වාර්තාව සැපයීම පැහැර හැරීමට හෝ සාවද්‍ය හෝ අසම්පූර්ණ වාර්තාවක් සැපයීමට හේතුව මණ්ඩලයට ඒත්තු යන පරිදි නැතහොත් තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ නිලධරයකුට ඒත්තු යන පරිදි දැක්වීමට ඒ සේවායෝජකයාට නොහැකි වුවහොත්, ඒ වාර්තාව සැපයිය යුතු වන්නේ යම් දිනයක දී ද නැතහොත් යම් දිනයකට පෙර ද, එදින සිට යථා පරිදි සම්පූර්ණ සහ නිරවද්‍ය වාර්තාවක් මණ්ඩලය වෙත ලැබෙන දිනය දක්වා කාලය වෙනුවෙන් ඒ වාර්තාවට සම්බන්ධ දායක මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් සෑම සම්පූර්ණ මාසයකට හෝ ඉන් කොටසකට සියයට එක බැගින් වූ අධිභාරයක් අරමුදලට ගෙවීමට ඒ සේවායෝජකයා යටත් වන්නේ ය. — 1993 අංක 18 දරන පනතින් සංශෝධනය වී ඇත.

38. මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් නැතහොත් මණ්ඩලය විසින් පහත දැක්වෙන කාර්ය සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් මේ පනතේ කාර්ය සඳහා —

ස්ථාන ආදිය පරීක්ෂා කිරීම මණ්ඩලයේ සාමාජිකයකු හෝ බලය ලත් නිලධරයකු සතු බලතල.

(අ) යම් සේවානියුක්තයකුගේ ඉපැයීම්වලට අදාළ යම් ලේඛනයක් හෝ වාර්තාවක් පරීක්ෂා කිරීම සඳහා දිවා හෝ රාත්‍රි කාලයේ සියලු යුක්තිසහගත වේලාවන්හි දී යම් ස්ථානයකට හෝ තැනකට ඇතුල්වී පරීක්ෂා කිරීම ;

(ආ) එවැනි යම් ලේඛනයක හෝ වාර්තාවක හෝ ඉන් කොටසක පිටපත් ගැනීම ;

(ඇ) සේවායෝජකයකු හෝ සේවානියුක්තයකු බවට විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇති යම් තැනැත්තකු පරීක්ෂා කිරීම ; සහ

(ඈ) යම් අර්ථ සාධක අරමුදලකට ගෙවනු ලබන දායක මුදල්වලට අදාළ යම් වාර්තා හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම

කළ හැකි ය.

39. (අ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග කිසිවක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින ; හෝ

වැරදි සහ දණ්ඩන

(ආ) මේ පනත යටතේ කරන ලද නැතහොත් දෙන ලද යම් විධානයක් හෝ නියමයක් හෝ අනුව ක්‍රියා කිරීම පැහැර හරින ; හෝ

(ඇ) මේ පනතේ 37 වන වගන්තිය යටතේ සැපයීමට නියම කරනු ලැබූ යම් වාර වාර්තාවක් හෝ තොරතුරක් අසත්‍ය බව දැනදැනම සපයන හෝ සැපයීමට සලස්වන

සෑම තැනැත්තකු ම, වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසක් නො ඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

40. මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක —— සංස්ථාගත කරන ලද හෝ සංස්ථාපිත කරනු නොලැබූ පුද්ගල මණ්ඩල විසින් සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන්ගේ වගකීම

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම් ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයෙක් ම සහ නිලධරයෙක් ම,

(ආ ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවෙක් ම,

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය වෘත්තීය සංගමයක් නම් ඒ වෘත්තීය සංගමයේ සෑම නිලධරයෙක් ම,

(ඈ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත කරනු නොලැබූ පුද්ගල මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයේ සභාපති, කළමනාකරු, ලේකම් සහ වෙනත් සෑම නිලධරයෙක් ම,

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම පිණිස තමා නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව හෝ යම් තැනැත්තකු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් සඳහා ආරක්ෂාව

40අ. සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා යන පරිකල්පනය මත හෝ මේ පනත යටතේ තමාගේ කාර්ය ඉටු කිරීමෙහි ලා හෝ සද්භාවයෙන් ක්‍රියා කිරීමේ දී මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයා, නිලධරයා හෝ සේවකයා සිවිල් බැඳීමකට හෝ සාපරාධී බැඳීමකට යටත් නොවන්නේ ය. 1988 අංක 47 දරන පනතින් සංශෝධනය වී ඇත.

40ආ. සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ විෂමාචාරය හෝ චේතනාන්විත පැහැර හැරීම හේතුකොටගෙන සිදුවී යැයි මණ්ඩලය විසින් සලකනු ලබන අලාභ සහ වියදම් හැර, මණ්ඩලයේ සෑම සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීම හා සම්බන්ධයෙන් හෝ දරන ලද සියලු අලාභ සහ වියදම් සඳහා, ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට අරමුදලින් හානිපූරණය කළ යුතු ය.

මණ්ඩලයේ ලිඛිත අනුමතය නොමැතිව වරදක් සඳහා නඩු පවරනු නොලැබිය යුතු බව.

41. මණ්ඩලයේ ලිඛිත අනුමතය මගින් හෝ ලිඛිත අනුමතය ඇතිව හෝ හැර, මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් කරනු නොලැබිය යුතු ය.

මේ පනත යටතේ නඩු පැවරීමක් සිවිල් නඩුවකට බාධාවක් නොවන බව.

42. මේ පනත යටතේ යම් වරදක් සඳහා යම් තැනැත්තකුට විරුද්ධව මේ පනත යටතේ පවරනු ලැබූ කිසිම නඩුවක් මේ පනතින් උද්ගත වන යම් කරුණක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් නඩුවකට බාධාවක් නොවිය යුතු ය.

නියෝග.

43. (1) අමාත්‍යවරයා විසින් —

(අ) නියමිත කාරණා වශයෙන් මේ පනතේ සඳහන් හෝ මේ පනතින් නියම කර ඇති හෝ සියලු කාරණා සම්බන්ධයෙන් ;

(ආ) නියෝග සෑදීමට මේ පනතින් නියම කර හෝ බලය දී හෝ ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන්ද, ඒ සියලු කාරණා සම්බන්ධයෙන් ;

(ඇ) මේ පනත යටතේ දායක මුදල් සහ වෙනත් ගෙවීම් එකතු කිරීමට සම්බන්ධ හෝ ඊට ආනුෂාංගික වන සියලු කාරණා සම්බන්ධයෙන් ;

(ඈ) වැරදීමකින් අරමුදලට ගෙවන ලද යම් මුදල් ප්‍රමාණ ආපසු ගෙවීම සම්බන්ධයෙන් ;

(ඉ) මේ පනත යටතේ යම් ප්‍රතිලාභියකුට හිමිකම් පාන්නකු වන දරුවකු නැතහොත් තත්කාලයෙහි ක්‍රියා කිරීමට නොහැකි විය හැකි තැනැත්තකු වෙනුවෙන්, මේ පනත යටතේ හිමිකම් පාන තැනැත්තකු විසින් ක්‍රියාත්මක කිරීමට හිමිකම් ලැබිය හැකි වූ යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීම සඳහා තැනැත්තකු පත් කිරීමට හැකි වනු පිණිස සහ හිමිකම් පාන තැනැත්තකු හිමිකම් ලබන ඒ ප්‍රතිලාභය භාර ගැනීමට සහ ඒ සම්බන්ධයෙන් සුදුස්සක් කිරීමට එසේ පත් කරනු ලබන තැනැත්කුට බලය දීම පිණිස ;

(ඊ) අරමුදලෙහි, යම් සාමාජිකයකුගේ පෞද්ගලික ගිණුමේ ඒ සාමාජිකයාගේ බැරට ඇති මුදල, ඒ සාමාජිකයාගේ මරණය සිදු වුවහොත් ගෙවනු ලැබිය හැකි තැනැතත්කු හෝ තැනැත්තන් ඒ සාමාජිකයා විසින් නම් කිරීම සහ ඒ නම් කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ ආකාරය සම්බන්ධයෙන් ;

(උ) මේ පනත යටතේ වූ යම් ප්‍රතිලාභයකට හිමිකම් පෑම පිළිබඳ තීරණය අභියාචනාධිකරණය විසින් සමාලෝචනය කරනු ලබන තෙක්, ඒ ප්‍රතිලාභය ප්‍රදානය කිරීම අත්හිටුවීම සඳහා ;

(ඌ) මේ පනත යටතේ සමාලෝචනයක් හෝ අභියාචනයක් පිළිබඳ යම් තීරණයක් බලපැවැත්විය යුත්තේ නැතහොත් බලපැවැත්විය යුතු ලෙස සලකනු ලැබිය යුත්තේ යම් දිනයක සිට ද ඒ දිනය සම්බන්ධයෙන් ;

(එ) මේ පනත යටතේ කරන ලද යම් තීරණයක් යටතේ හෝ යම් නියෝගයක විධිවිධාන ප්‍රකාර යම් තැනැත්තකුට ගෙවන ලද එහෙත් ගෙවනු නොලැබිය හැකි බවට පසුව තීරණය කරනු ලැබූ යම් මුදලක් නිසි ලෙස ගෙවන ලද බවට සැලකීම සඳහා හෝ ඒ මුදල ඒ තැනැත්තා විසින් ආපසු ගෙවීම සඳහා හෝ ඔහුගෙන් අය කර ගැනීම සඳහා ;

(ඒ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී සේවයෙහි නියුක්ත කරනු ලැබූ නිලධරයන් ට සහ සේවකයන්ට දීමනා ගෙවීම සහ ඒ දීමනා ආගණනය කිරීමේ ක්‍රමය සම්බන්ධයෙන්

නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ විට, හෝ නියෝගයේ සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම එය පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එය යටතේ කලින් කරන ලද කිසිවකුට හානියක් නොමැතිව එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපනය

44. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි —

“යථා පරිදි සංයුක්ත කරන ලද වෛද්‍ය මණ්ඩලය” යන්නෙන් යම් තැනැත්තන් විසින් ඉදිරිපත් කරන ලද වෛද්‍ය සහතික සාධාරණ සැකයක් මතු කරයි ද, ඒ තැනැත්තන් පරීක්ෂා කිරීමේ කාර්ය සඳහා, මණ්ඩලයේ සභාපතිවරයා විසින් කරන ඉල්ලීමක් අනුව සෞඛ්‍ය සේවා

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරන ලද වෛද්‍ය මණ්ඩලයක් අදහස් වේ ;

"ඉපැයීම්" යන්නෙන් පහත දැක්වෙන දේ අදහස් වේ: — 1993 අංක 18 දරනසේවා නියක්තයන්ගේ භාර අරමුදල් 3 (සංශෝධන) පනත

(අ) වේතන, වැටුප් හෝ ගාස්තු ;

(ආ)ජීවන වියදම් දිමනාව, විශේෂ ජීවන වියදම් දීමනා සහ වෙනත් යම් දීමනා;

(ඇ) නිවාඩු දින සම්බන්ධයෙන් කරනු ලබන ගෙවීම්;

(ඈ) සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ සාදනු ලැබූ නියෝගවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි,සේවා යෝජකයා විසින් සේවයේ නියුක්ත කොට ඇති සේවා නියුක්තයන්ට සපයනු ලැබූ පිසින ලද හෝ නොපිසින ලද යම් ආහාරයක් මිලට ගැනීමේ දී ගෙවන ලද වටිනාකම් සහ එසේ සපයන ලද යම් ආහාරයක් පිළියෙළ කිරීමේ දී හෝ සංයෝග කිරීමේදී භාවිතා කරන ලද යම් ද්‍රව්‍යයක් මිලට ගැනීමේ දී ගෙවන ලද වටිනාකම, තව ද, ඒ වටිනාකම කම්කරු කොමසාරිස්වරයා වෙත අභියාචනය කරනු ලැබීමට යටත්ව,සේවායෝජකයා විසින් තක්සේරු කරනු ලැබිය යුතු අතර,එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයාගේ තීරණය අවසානාත්මක වන්නේය.

(ඉ) ආහාර සඳහා දිමනා ; සහ

(ඊ) සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ සාදනු ලැබූ නියෝගවලින් නියමිත වෙනත් ආකාරයේ පාරිශ්‍රමික ;

"සේවා නියුක්තයා" යන්නෙන්, සේවා නියුක්තිය පිළිබඳ ගිවිසුම ප්‍රකාශිත හෝ ගම්‍ය මාන නැතහොත් වාචික හෝ ලිඛිතව වුවද ඒ ගිවිසුම සේවය සම්බන්ධයෙන් හෝ ආධුනිකත්වය සම්බන්ධයෙන් හෝ ගිවිසුමක් වුවද නැතහොත් ශ්‍රමය සම්බන්ධයෙන් වු යම් වැඩක් පෞද්ගලිකවම ක්‍රියාත්මක කිරීම පිණිස වූ ගිවිසුමක් වුවද කවර වූ හෝ යම් තත්වයකින් සේවා යෝජකයකු සමග ගිවිසුමකට ඇතුළු වූ හෝ ගිවිසුමක් යටතේ වැඩකරන යම් තැනැත්තකු අදහස් වන අතර යම් තැනැත්තෙකු යම් විශේෂ අවස්ථාවක දී සේවයෙහි නියුක්ත වුවද සේවයෙහි නියුක්ත නොවූවද එවැනි යම් ගිවිසුමක් යටතේ සාමාන්‍යයෙන් සේවයෙහි නියුක්ත ඒ තැනැත්තා ද ඊට ඇතුලත් වේ; 1988 අංක 47 දරන පනතින් සංශෝධනය වී ඇත

"සේවායෝජක" යන්නෙන්, යම් කම්කරුවකු සේවයේ නියුක්ත කරන යම් තැනැත්තෙකු හෝ යම් තැනැත්තකු විසින් වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරනු ලැබේ ද ඒ වෙනත් යම් තැනැත්තා හෝ අදහස් වන අතර, සේවායෝජක මණ්ඩලයක් (ඒ මණ්ඩලය,ව්‍යාපාරික ආයතනයක්, සමාගමක්, සංස්ථාව,පළාත් පාලන ආයතනය හෝ වෘත්තීය සමිතියක් වුව ද) ඒ මණ්ඩලය ද වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් කම්කරුවකු සේවයේ නියුක්ත කරන යම් තැනැත්තකු ඊට ඇතුලත් වේ.තවද යම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ වෙළඳ ආයතනයක නිසි බලධරයකු,නීතයානුකූල උරුමකරු,නීතිය අනුව අනුප්‍රාප්තිකයා පොල්මඃකාරයකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු සහ සමාගමක ඇවරකරුද ඇතුළත් වේ; තවද සංස්ථාගත නොකල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට ඒ මණ්ඩලයේසභාපතිවරයා හෝ ලේකම්වරයා ද,හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන විට එහි කළමනාකාර හවුල්කරුවකු හෝ කළමනාකරුවකු ද ඇතුලත් වේ ;

1988 අංක 47 දරන පතින් සංශෝධනය වී ඇත.

1993 අංක 18 දරන පනතින් සංශෝධනය වී ඇත.

"පළාත් පාලන ආයතනය"යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක්, හෝ ප්‍රාදේශිය සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන, කරන හා ඉටුකරන යම් බලතලවලට, කාර්යවලට හෝ කර්තවයවලට අනුරූප හෝ සමාන බලතල,කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරිම, කිරීම සහ ඉටුකිරීම සඳහා යම් නීතියක් මගින් හෝ යටතේ ඇති කරන ලද හා පිහිටුවන ලද කවර හො අධිකාරියක් ඊට ඇතුලත් වේ;

1988 අංක 47 දරන පනතින් සංශෝධනය වී ඇත

" සංක්‍රමණික කම්කරුවා"යන්නෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නා වු එහෙත් ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්තව ඇති යම් තැනැත්තෙක්, එසේ සේවයෙහි නියුක්තව ඇති තාක් කල් අදහස් වේ ;

1988 අංක 47 දරන පනතින් සංශෝධනය වී ඇත

"නියමිත " යන්නෙන්,නියෝගයක් මගින් නියම කිරීම අදහස් වේ ;

"පෞද්ගලික අංශයේ ව්‍යවසාය"යන්නෙන්, පෞද්ගලික අංශයේ සේවා යොජකයකු විසින් පවත්වා ගෙන යනු ලබන යම් ව්‍යවසායක් සහ ස්වයං රැකියාවක නියුක්ත තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන යම් ව්‍යයසායක් අදහස් වේ;

“රාජ්‍ය සංස්ථාව’ යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද්දා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නාවූ ද සංස්ථාවක, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ;

“ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකය” යන්නෙන්, වෛද්‍ය ආඥාපනත යටතේ ලියාපදිංචි වූ වෛද්‍ය වෘත්තිකයකු හෝ 1961 අංක 31 දරන ආයුර්වේද පනත යටතේ ලියාපදිංචි වූ ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයකු හෝ අදහස් වේ ;

“රාජ්‍ය ව්‍යවසාය” යන්නෙන් යම් රාජ්‍ය සංස්ථාවක් හෝ යම් ලිඛිත නීතියක් යටතේ ආන්ඩුව සතු කරනු ලැබූ යම් වෙළෙඳ ව්‍යවසායක් හෝ ඒ සංස්ථාව හෝ වෙළෙඳ ව්‍යවසායේ ශාඛාවක් හෝ කොටසක් හෝ අදහස් වේ.

අන්තර්කාලීන විධිවිධාන.

ප්‍රධාන ප්‍රඥාප්තියේ කුමක් සඳහන්ව තිබුන ද, —

1988 අංක 47 දරන පනතින් සංශෝධනය වී ඇත.

(අ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත මඟින් පිහිටුවන ලද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ ඒ පනතේ අර්ථානුකූල උසස් අධ්‍යාපන ආයතනයක හෝ;

(ආ) 1971 අංක 19 දරන ජාතික ආධුනිකත්ව පනත මඟින් පිහිටුවන ලද ජාතික අධුනිකත්ව මණ්ඩලයේ සේවානියුක්තයකුගේ පෞද්ගලික ගිනුමේ බැරට, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී ඇති මුදල, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට මාස හයක් ඇතුළත ඒ සේවා නියුක්තයාට මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතුය .

අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

1993 අංක 18 දරන පතින් සංශෝධනය වී ඇත.

<u>1993 අංක 19 දරන පනතින් සංශෝධනය වී ඇත.</u>

1978 අංක 16දරන පනතේ 97අ වගන්තිය ඉවත්කිරීම.

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 97අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

1993 අංක 19 දරන පනතින් සංශෝධනය වී ඇත.

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතන වල සේවා නියුක්තයන්ට අදාල කිරීම.

1980 දෙසැම්බර් මස 9 වන දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන විශ්ව විද්‍යාල ප්‍රතිපාන කොමිෂන් සභාවට සහ සෑම උසස් අධ්‍යාපන ආයතනයකටම අදාල වන්නේ යැයි සලකනු ලැබිය යුතු අතර,ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය යටතේ අරමුදලට දායක මුදල් ගෙවීමෙහි ලා විශ්ව විද්‍යාල ප්‍රතිපාදනකොමිෂන් සභාවට හා සෑම උසස් අධ්‍යාපන ආයතනයකටම ඇති වගකීම 1981 මාර්තු මස 1 වන දින ආරම්භ වූ ලෙස සකනු ලැබිය යුතුය.

(2)මේ පනත ආරම්භ විමේ දිනයට පෙරාතුව වූ යම් කාලයක් සඳහා, අවස්ථාවෝචිත පරිදි, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවා නියුක්තයකු වන හෝ සේවා නියුක්තයකුව සිටි තැනැත්තකු සම්බන්ධයෙන් ,මේ පනත ආරම්භ වීමේ දිනයේ සිට මාස හයක් ඇතුළත පහත දැක්වෙන මුදල් ප්‍රමාණය ඒ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපනය ආයතනය විසින් අරමුදලට ගෙවනු ලැබුව හොත්,ඒ තනැත්තා සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ ඒ උසස් අධ්‍යාපන ආයතනය හෝ විසින් දායක මුදල් ගෙවිය යුතු බව නියම කෙරෙන, ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ විධිවිධාන අනුව විශ්ව විද්‍යාල කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතනය ක්‍රියාකර ඇතැයි, සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය. එනම් —

(අ) ඒ තැනැත්තා 1981 මාර්තු 1 වන දින විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක හෝ සේවා නියුක්තයකුව සිටි මේ පනත ආරම්භ වීමේ දිනයේ දී අවස්ථාවොචිත පරිදි, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ ඒ උසස් අධ්‍යාපනආයතනයේ සේවා නියුක්තයතු වශයෙන් දිගටම සිටින යම් අවස්තාවක දී, 1981 මාර්තු මස 1 වන දිනයෙන් ආරම්භව මේ පනත ආරම්බ වීමේ දිනයෙන් අවසන් වන කාලය තුල,අවස්ථාවෝචිත පරදි , විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනය විසින් ඒ තැනැත්තා වෙනුවෙන් අඩු කොට ,එකී කාලයේ එක් එක් මාසය සඳහා ඒ තැනැත්තාගේ මුළු ඉපැයීම් වලින් සියයට තුනකට සමාන මුදලක් ;

(ආ) ඒ තැනැත්තා 1981 මාර්තු මස 1 වන දිනයට පසු යම් දිනයයක විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධයාපන ආයතනය හෝ සේවා නියුක්තයකු වී, මේ පනත ආරම්භ වීමේ දිනයේ දී අවස්ථාවෝචිත පරිදි, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ සේවා නියුක්තයකු වශයෙන් දිගටම සිටින යම් අවස්ථාවක ,ඒ තැනැත්තා අවස්ථාවෝචිත පරිදි,විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධයාපන ආයතනය සේවා නියුක්තයකු වු දිනයෙන් ආරම්භ වන මේ පනත ආරමභවීමේ දිනයෙන් අවසන් වන කාලය තුළ,විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ ඒ උසස් අධ්‍යාපන ආයතනය විසින් ඒ තැනැත්තා වෙනුවෙන් අරමුදලට ගෙවනු ලැබුවා වූ යම් දායක මුදල් ප්‍රමාණයක් අඩුකොට, එකී කාලයේ එක් එක් මාසය සඳහා ඒ තැනැත්තාගේ මුළු ඉපැයීම් වලින් සියයට තුනකට සමාන මුදලක් ;

(ඇ) ඒ තැනැත්තා 1981 මාර්තු මස 1 ව දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවා නියුක්තයකු සිට මේ පනත ආරම්භ වීමේ දිනයට පෙරාතුව වූ දිනයක, අවස්ථාවෝචිත පරිදි, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනයේ සේවා නියුක්තයකුව සිටීම අවසන් වී ඇති යම් අවස්ථාවක 1981 මාර්තු මස 1වන අවසන් දිනයෙන් ආරම්භව අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනයේ සේවා නියුක්තයකව සිටීම අවසාන වූ දිනයේ දී අවසන් වන ඒ කාලය තුල අවස්ථාවෝචිත පරිදි,විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනය විසින් ඒ තැනැත්තා වෙනුවෙන් අරමුදලට ගෙවනු ලැබුවා වූ යම් දායක මුදල් ප්‍රමාණයක් අඩුකොට,එකී කාලයේ එක් එක් මාසය සඳහා ඒ තැනැත්තාගේ මුළු ඉපයීම් වලින් සියයට තුනකට සමාන මුදලක් ;

(ඈ)ඒ තැනැත්තා 1981 මාර්තු මස 1 වන දිනයට පසු යම් දිනයක විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවා නියුක්තයකු වී, මේ පනතත ආරම්භ වීමේ දිනයට පෙරාතුව වූ දිනයක , අවස්ථාවෝචිත පරිදි ,විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ සේවා නියුක්තයකුව සිටීම අවසන් වී ඇති යම් අවස්ථාවක, ඒ තැනැත්තා, අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ සේවා නියුක්තයකු වූ දිනයෙන් ආරම්භව, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ සේවා නියුක්තයකුව සිටීම අවසාන වූ දිනයෙන් අවසන් වන කාලය තුළ, අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනය විසින් ඒ තැනැත්තා වෙනුවෙන් අරමුදලට ගෙවනු ලැබුවා වූ යම් දායක මුදල් ප්‍රමාණයක් අඩුකොට , එකී කාලයේ එක් එක් මාසය සඳහා ඒ තැනැත්තාගේ මුළු ඉපයීම් වලින් සියයට තුනකට සමාන මුදලක් ;

යම් තැනැත්තකු වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනයක් විසින් (1) වන උප වගන්තිය යටතේ කරන ගෙවීම කිසිවක් , මණ්ඩලය විසින් අරමුදලේ ඒ තැනැත්තාගේ පෞද්ගලික ගිණුමට බැර කරනු ලැබිය යුතුය.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි —

"මණ්ඩලය" යන්නෙහි, ප්‍රදාන ප්‍රඥප්තිය මගින් පිහිටුවනු ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය අදහස් වේ;

"අරමුදල" යන්නෙන්, ප්‍රධාන ප්‍රඥප්තිය මගින් පිහිටු වන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල අදහස් වේ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත.

"ප්‍රධාන ප්‍රඥප්තිය" යන්නෙන්, 1980 අංක 4 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත අදහස් වේ;

"විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ.